ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

අති විශෙෂ

අංක 2509/28 – 2026 ඔක්තෝබර් මස 07 වැනි බදාදා – 2026.10.07

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)

I වැනි කොටස: (I) වැනි ඡෙදය – සාමාන්‍ය

රජයේ නිවේදන

මගේ අංකය - IR/COM/02/2023/186

කාර්මික ආරාවුල් පනත - 131 වන අධිකාරය

131 වන අධිකාරය වන සංශෝධිත කාර්මික ආරාවුල් පනතේ 4(1) වගන්තිය යටතේ 2024.07.01 දිනැති හා අංක 2391/05 දරන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ *අති විශෙෂ ගැසට් පත්‍රයේ* ප්‍රසිද්ධ කරන ලද 2024.06.20 දින දරන නියෝගයෙන්, එක් පාර්ශ්වයක් වශයෙන් 1. වැල්ලම්පිටිය, ඔරුගොඩවත්ත, බෙස්ලයින් පාර, නො.60/460, ශ්‍රී ලංකා පරමාණුක බලශක්ති මණ්ඩලය හි ප්‍රසාද් ධනංජය මහකුමාර මයා, 2. වැල්ලම්පිටිය, ඔරුගොඩවත්ත, බෙස්ලයින් පාර, නො.60/460, ශ්‍රී ලංකා පරමාණුක බලශක්ති මණ්ඩලය හි නිරාශා ගයානි රත්නවීර මිය සහ අනෙක් පාර්ශ්වය වශයෙන් වැල්ලම්පිටිය, ඔරුගොඩවත්ත, බෙස්ලයින් පාර, නො.60/460, හි පිහිටි ශ්‍රී ලංකා පරමාණුක බලශක්ති මණ්ඩලය අතර පවත්නා කාර්මික ආරාවුල බෙරුම් කිරීමෙන් සමථයකට පත් කිරීම සඳහා යොමු කරන ලදුව, බෙරුම්කරු විසින් මා වෙත එවා ඇති අංක A 29/2024 හා 2026.06.26 දිනැති ප්‍රදානය එම පනතේ 18(1) වගන්තිය යටතේ මෙයින් ප්‍රකාශයට පත් කරනු ලැබේ.

එච්. එම්. ඩී. එන්.කේ.වටලියද්ද,
කම්කරු කොමසාරිස් ජනරාල්,

2026 සැප්තැම්බර් 17 දින,
කම්කරු දෙපාර්තමේන්තුව,
කොළඹ 05.

1A – G 048082 – 10 (2026/10)

මෙම අති විශෙෂ ගැසට් පත්‍රය www.documents.gov.lk *වෙබ් අඩවියෙන් බාගත කළ හැක.*

කොළඹ බේරුම්කරණ හා කාර්මික අධිකරණ ශාඛාවේදීය

නඩු අංකය :- A/29/2024
යොමු අංකය :- IR/COM/02/2023/186

1) ප්‍රසාද් ධනංජය මහකුමාර මයා,
ශ්‍රී ලංකා පරමාණුක බලශක්ති මණ්ඩලය,
නො.60/460, බෙස්ලයින් පාර,
ඔරුගොඩවත්ත,
වැල්ලම්පිටිය.

2) නිරාෂා ගයානි රත්නවීර මෙය
ශ්‍රී ලංකා පරමාණුක බලශක්ති මණ්ඩලය,
නො.60/460, බෙස්ලයින් පාර,
ඔරුගොඩවත්ත,
වැල්ලම්පිටිය.

පළමු පාර්ශ්වය

සහ

ශ්‍රී ලංකා පරමාණුක බලශක්ති මණ්ඩලය,
නො. 60/460, බෙස්ලයින් පාර,
ඔරුගොඩවත්ත,
වැල්ලම්පිටිය.

දෙවන පාර්ශ්වය

ප්‍රදානය

කම්කරු හා විදේශ රැකියා අමාත්‍ය මනුෂ නානායක්කාර මැතිතුමා විසින් අංක 1957 අංක 14 හා 1957 අංක 62 හා 1962 අංක 4 හා 1968 අංක 39 (1968 අංක 37 දරන කාර්මික ආරාවුල් (විශේෂ ප්‍රතිපාදන)පනත සමග කියවා) දරන පනත් වලින් සංශෝධිත වූ ලංකාවේ ව්‍යවස්ථාපිත අණපනත්වල 131 වන පරිච්ඡේදය(1956 ප්‍රතිශෝධිත මුද්‍රණය) වන කාර්මික ආරාවුල් පනතේ 4 (1) වන වගන්තියෙන් ඔහු වෙත පැවරී ඇති බලතල අනුව, එකී ආරාවුල බේරුම් කිරීමෙන් නිරවුල් කිරීම සඳහා බේරුම්කරු වශයෙන් පිලියන්දල, බුද්ධාලෝක මාවතේ, අංක:40හි ආචාර්ය කේ.ඒ.තිලකරත්න වන මා පත්කර ඇත.

ඉහත සඳහන් පාර්ශ්වයන් අතර පවතින කාර්මික ආරාවුලට හේතු වී පවත්නා කරුණු වනුයේ,

"බාහිර පුද්ගලයෙකු විසින් 2021 වසරේ ආයතනයේ උපකරණ යැයි පැවසෙන Automess Scintillator probe නමැති විකිරණ මනින උපකරණයක් ශ්‍රී ලංකාවෙන් බැහැරට (මාලදිවයින වෙත) ගෙනයාමක් සම්බන්ධයෙන් සිදු කළ විනය පරීක්ෂණයේ දී හා අනතුරුව ලබා දී ඇති දඬුවම මගින් ශ්‍රී ලංකා පරමාණුක බලශක්ති මණ්ඩලයේ විකිරණ ආරක්ෂණ හා තාක්ෂණික සේවා අංශයේ විද්‍යාත්මක නිලධාරිනියක ලෙස සේවය කරන නිරාශා ගයානි රත්නවීර මෙයට හා එම අංශයේම අධ්‍යක්ෂක ලෙස සේවය කරන ප්‍රසාද් ධනංජය මහ කුමාර මයා හට අසාධාරණයක් සිදුව තිබේ ද යන්නත් එසේ අසාධාරණයක් සිදුව තිබේ නම් ඔවුන්ට හිමිවිය යුතු සහන කවරේ ද යන්නත් පිළිබඳව වේ."

මෙම කාර්මික ආරාවුල 2024.08.08,2024.10.10, 2025.01.10, 2023.03.21, 2025.04.08, 2025.06.13, 2025.07.07, 2025.08.21, 2025.10.02, 2025.10.13, 2025.11.25,2025.12.18, 2026.01.13, 2026.02.03, 2026.03.03, 2026.04.30, 2026.05.22 යන දිනයන් හිදී විභාගයට ගැනුණි.

ආරාවුලට තුඩුදුන් කාරණය:-

මෙම බේරුම්කරණ නඩුවෙහි පළමු පාර්ශ්වකරුවන් හෙවත්, පැමිණිලිකාර පාර්ශ්වයන් වන ප්‍රසාද් ධනංජය මහකුමාර මහතා හා නිරාෂා ගයානි රත්නවීර මෙය ශ්‍රී ලංකා පරමාණුක බලශක්ති මණ්ඩලයෙහි ජ්‍යෙෂ්ඨ නිලධාරීන් දෙදෙනෙකි. ප්‍රසාද් ධනංජය මහකුමාර මහතා 2001.03.15 දින සිට මෙම ආයතනයේ සේවය කොට ඇති අතර, 2023.07.31 දින වන විට අධ්‍යක්ෂ විකිරණ ආරක්ෂණ සහ තාක්ෂණික සේවා අංශයෙහි සේවය කොට ඇත. එමෙන්ම නිරාෂා ගයානි රත්නවීර මෙය 2012.03.12 දින වගඋත්තරකාර ආයතනයේ සේවයට බැඳී 2023.07.31 වන විට නියෝජ්‍ය අධ්‍යක්ෂ, කර්මාන්ත යෙදවුම් ලෙස සේවයේ නිරතව සිට ඇත.

2021.11.27 දින ශ්‍රී ලංකා පරමාණුක බලශක්ති මණ්ඩලයේ හිටපු අධ්‍යක්ෂවරයෙකු වන අනුරුද්ධ ජයලත් යන අය දෙවන පාර්ශ්වයට අයත් විශේෂිත විකිරණ මනින උපකරණයක් වෙනත් රටකට කටුනායක ගුවන් තොටුපලෙන් පිටතට ගෙන ගොස් තිබූ බවට රත්නායක ආරච්චිලාගේ ශාන්ත ලාල් රත්නායක යන අයකු විසින් 2021.11.29 දින මෙම මණ්ඩලයේ අභ්‍යන්තර විගණන නිලධාරියාගේ විද්‍යුත් තැපෑල් ලිපිනයට ලැබුණු පැමිණිල්ලකට අනුව පරීක්ෂණයක් ආරම්භ කොට ඇත. මෙම පැමිණිල්ලෙහි ඉදිරි පියවරක් වශයෙන් දෙවන පාර්ශ්වකාර ආයතනයේ සභාපතිවරයා විසින් සිදුවීම් පිළිබඳ සම්පූර්ණ වාර්තාවක් පළමු පාර්ශ්වය වෙතින් ඉල්ලා ඇත.

ඒ අනුව පළමු පාර්ශ්වය විසින් තවත් නිලධාරීන් දෙදෙනෙකු සමග භාණ්ඩ පරීක්ෂා කර අවසන් කරන ලද වාර්තාව 2021.12.02 දින ආයතනයේ සභාපති වෙත භාර දී ඇත.

මාලදිවයින වෙත රැගෙන ගිය බවට කියන විද්‍යුත් උපකරණය පිළිබඳව යලි යලිත් විද්‍යුත් තැපෑල මඟින් දෙවන පාර්ශ්වයේ නිලධාරීන් වෙත පැමිණිලි ලැබී තිබුණි. ඒ අනුව අභ්‍යන්තර විගණන හා නීති නිලධාරිනිය 2021.12.02 දින උපකරණ හා ඉන්වෙන්ට්‍රි ලේඛන පරීක්ෂාවක් සිදුකර ඇති අතර, ආයතනය සතුව ප්‍රශ්න ගත උපකරණ 05 ම ඉන්වෙන්ට්‍රියේ සඳහන් අනුක්‍රමික අංකයන් හා සැසඳෙන බව වාර්තා කර ඇත.

2021.12.08 දින දෙවන පාර්ශ්වය ආයතනයේ සභාපති පොලිස්පතිට පිටපත් සහිතව විදුලිබල අමාත්‍යාංශයේ ලේකම් වෙත යවන ලද ලිපියෙන් දක්වා ඇත්තේ, "පැමිණිල්ල පිළිබඳ විර්මශනයක් සිදුකර ඇති බවත්, ආයතනයේ ඉන්වෙන්ට්‍රි ගත කර ඇති සියලුම විකිරණ මනින උපකරණ ඒ අයුරින්ම පවතින බවත්, ඉන් කිසිවක් අනවසරයෙන් බැහැරට ගෙන ගොස් ඇති බවට සාක්ෂි නොපවතින බවත් ඒ පිළිබඳව පෞද්ගලිකවම නිරීක්ෂණය කළ බවත්ය."

2022.01.07 දින මෙම සිදුවීමට අදාළව මූලික විර්මශනයක් පවත්වා ඇත. එමෙන්ම 2022.06.08 දිනැති ලිපියන් මඟින් පළමු පාර්ශ්වයට එරෙහිව චෝදනා පත්‍ර නිකුත් කර ඇති අතර, 2022.06.15 දින ඊට නිදහසට කරුණු ඉදිරිපත් කර ඇත.

චෝදනා පත්‍රය පිළිබඳව විශ්‍රාමික බන්ධනාගාර කොමසාරිස්වරයෙකු මඟින් විධිමත් විනය පරීක්ෂණයක් පවත්වා ඇත. ඒ අනුව පළමු පාර්ශ්වයට එරෙහිව නගා ඇති චෝදනා වලට පළමු පාර්ශ්වය වරදකරු යැයි නිගමනය කර තිබුණි.

මෙම සිදුවීම පිළිබඳව දෙවන පාර්ශ්වය අපරාධ පරීක්ෂණ දෙපාර්තමේන්තුව වෙත පැමිණිල්ලක් සිදුකර ඇත. ඒ සම්බන්ධව ගරු මහේස්ත්‍රාත් අධිකරණයක නඩු කටයුත්තක් ද පවතී. විනය පරීක්ෂණයේ තීරණ වලට එරෙහිව පැමිණිලිකරුවන් විසින් රේඛීය අමාත්‍යාංශය වෙත අභියාචනා සිදුකර ඇත.

රේඛීය අමාත්‍යාංශයේ 04.11.2024 ලිපිය මඟින් දක්වා ඇත්තේ මෙම කරුණු සම්බන්ධයෙන් මහේස්ත්‍රාත් අධිකරණයෙහි නඩු කටයුත්තක් විභාග වෙමින් පවතින බැවින් එම නඩු කටයුතු අවසන් කරන තුරු මෙම අභියාචනය විභාග කර අමාත්‍යාංශ මට්ටමින් තීරණයක් ලබා දීම සිදු නොකළ යුතු බවට අමාත්‍යාංශ ලේකම්වරයා උපදෙස් ලබා දී ඇති බවයි.

වැඩිදුර සාක්ෂි සම්පිණ්ඩනය

ඉතා දීර්ඝ කාලයක් ගරු බේරුම්කරණ අධිකරණය මෙම නඩුකරය පවත්වාගෙන යන ලද අතර, ඉතා පුළුල්ව සාක්ෂි විමසීමක් ද සිදුකර ඇත. ආරාවුල පිළිබඳ පැන නැගුන කරුණු පිළිබඳව මෙම අධිකරණය තම අවධානය යොමු කරන ලදී.

1. ප්‍රශ්න ගත විකිරණ මනින උපකරණය මාලදිවයින වෙත ගෙන ගියේද නැද්ද යන්න අතිශයින්ම විවාදාත්මක විය. පැමිණිලිකාර පාර්ශවය විවිධ සාක්ෂි මඟින් පෙන්නුම් කර ඇත්තේ මෙම උපකරණය තමන් භාරයේ පැවති බවය. එමෙන්ම දෙවන පාර්ශ්වය විසින් ඉතා පුළුල් වශයෙන් කරුණු පෙන්නුම් කරන්නේ ශ්‍රී ලංකා පරමාණුක බලශක්ති මණ්ඩලය සතු වූ මෙම විද්‍යුත් උපකරණය අනවසරයෙන් හා නීති විරෝධීව රටින් ඉවතට ගෙන ගොස් තිබුණු බවය. සැබවින්ම මෙම උපකරණය රටින් ඉවතට ගෙන යාම පිළිබඳව පුළුල්

විර්මශනයක් අවශ්‍ය වේ. එවැන්නක් ශ්‍රී ලංකා පොලිසිය හෝ අපරාධ පරීක්ෂණ දෙපාර්තමේන්තුව විසින් කළ යුතු කාර්යයක් බව ගරු ඛෙරුම්කරණයෙහි අදහසයි.

2. ශ්‍රී ලංකා පරමාණුක බලශක්ති පනත අනුව න්‍යෂ්ටික, බලශක්ති, මුහුදේ, නීති, සෞඛ්‍ය හා කර්මාන්ත යන ක්ෂේත්‍රයන්හි අත්දැකීම් සහිත විශේෂඥවරුන් විසින් මෙහි අධ්‍යක්ෂක මණ්ඩලය සමන්විත වේ. කෙසේ වෙතත් මෙම විද්‍යුත් උපකරණය පිටතට ගෙනයාම හෝ නැවත ආයතනය තුළට ගෙන ඒමක් සිදුවූවා නම් එය නිශ්චිතව හඳුනා ගැනීමට තිබූ අවස්ථා මෙම විශේෂඥවරුන්ගෙන් යුත් අධ්‍යක්ෂක මණ්ඩලය හා වගකිව යුතු නිලධාරීන් පැහැර හැර ඇත.

3. අමාත්‍යාංශයේ අභ්‍යන්තර විගණන වාර්තාව අනුව අමාත්‍යාංශයේ අතිරේඛ ලේකම් දෙවන පාශ්වයේ සභාපති වෙත 2023.03.22 ලිපියෙන් දන්වා ඇත්තේ "රජය සතු වන්කම් ඉතා සංවේදී උපකරණයක් අනවසරයෙන් පෞද්ගලික ප්‍රතිලාභ ලබා ගැනීම සඳහා සංවිධානාත්මකව ආයතනයෙන් පිටතට ගෙන ගොස් අවස්ථා දෙකකදී රටින් පිටතට ගෙන ගොස් තිබීම මගින් රජයේ දේපළක් අවභාවිතා කර ඇත. ඊට අදාළව නිලධාරීන්ට මේ දක්වා විනය ක්‍රියාමාර්ගයක් ගෙන නොමැති අතර, ඒ සම්බන්ධයෙන් අධිකරණයට වාර්තා කිරීමට අධ්‍යක්ෂ මණ්ඩලය හෝ ඉහළ කළමනාකරණය කටයුතු කර නොමැත." යනුවෙනි.

4. විදුලිබල හා බලශක්ති අමාත්‍යාංශයේ ප්‍රධාන අභ්‍යන්තර විගණන අමාත්‍යාංශ ලේකම් අමතන ලද 2023 මාර්තු මස වාර්තාවට අනුව,

"2021.11.29 දින විද්‍යුත් පණිවිඩයක් මගින් ලැබුණු පැමිණිල්ලකට අනුව අදාළ භාණ්ඩ භෞතිකව තිබේද යන්න ස්තිරවම සනාථ කර ගෙන ඇත්තේ 2021.12.02 වන දින බව නිරීක්ෂණය වේ. ඒ අනුව අදාළ පැමිණිල්ල සම්බන්ධයෙන් කඩිනමින් විමර්ශනයක් සිදුකිරීමට ශ්‍රී ලංකා පරමාණුක බලශක්ති මණ්ඩලයේ පරිපාලනය ක්‍රියා නොකළ බව පෙනීයයි. Auto messScitillatorProbe උපකරණය විද්‍යාගාරයේ භෞතිකව පවතිද යන්න, විනාඩි දෙකක් තරම් සුළු කාලයකදී සනාථ කිරීමට හැකියාවක් තිබුණද, ඒ සඳහා දින දෙකක් තරම් අනවශ්‍ය කාලයක් වැය කර ඇති බව නිරීක්ෂණය විය."

5. දෙවන පාර්ශ්වය හෙවත් ශ්‍රී ලංකා පරමාණුක බලශක්ති මණ්ඩලය සභාපති විසින් අමාත්‍යාංශ ලේකම් අමතන ලද 2001.10.03 ලිපිය

"ආයතනයේ ඉන්වෙන්ට්‍රි ගත කර ඇති සියලුම විකිරණ මිනුම් උපකරණ ඒ අයුරින්ම පවතින බවත්, ඉන් කිසිවක් අනවසරයෙන් බැහැර ගෙන ගොස් ඇති බවට සාක්ෂි නොපවතින බවත්, මා පෞද්ගලිකව නිරීක්ෂණය කරන ලදී. එබැවින් ආයතනය හා එහි නිලධාරීන් සම්බන්ධව වන මෙම පැමිණිල්ලේ සඳහන් චෝදනා සත්‍යයෙන් තොර බවට දන්වා සිටිමි."

6. දෙවන පාර්ශ්වය ආයතනයේ අධ්‍යක්ෂ ජනරාල්, අමාත්‍යාංශ ලේකම් ඇමතූ 2021.12.02 දිනැති ලිපිය,

" මා අද දින පෙ.ව.9.45ට පමණ අදාළ විද්‍යාගාරය පෞද්ගලිකව පරීක්ෂාවට ලක්කල අතර, ඉන්වෙන්ට්‍රි ගතකළ උපකරණ සියල්ල ඒ ආකාරයෙන්ම පැවතුන බව සහතික කරමි."

ප්‍රදානය

ඉහත සඳහන් කරුණු ද සැලකිල්ලට ගෙන පැමිණිලිකරුවන් වන ප්‍රසාද් ධනංජය මහ කුමාර මයා හා නිරාෂා ගයානි රත්නවීර මෙය සම්බන්ධව ගරු ඛෙරුම්කරණ අධිකරණ තීන්දු ප්‍රකාශන පහත සඳහන් පරිදි සටහන් කරමි.

පළමු පැමිණිලිකරු වන ප්‍රසාද් ධනංජය මහකුමාර මහතාට

1. සේවා තත්ත්වයෙන් පහත හෙළීමේ විනය නියෝගය අහෝසි කර විකිරණ, ආරක්ෂණ හා තාක්ෂණික සේවා අංශයේ අධ්‍යක්ෂ තනතුරේ යලි පිහිටුවා පළමු පාර්ශ්වයට අහිමි වූ සියලු වරප්‍රසාද හා දීමනා හිඟ මුදල් ද සමඟ නැවත ලබා දිය යුතුය.

2. පළමු පාර්ශ්වයට එරෙහිව දෙවන පාර්ශ්වය ගෙන ඇති ජ්‍යෙෂ්ඨත්වයෙන් වසර තුනකින් පහත හෙළීමේ විනය නියෝගය අහෝසි කරනු ලැබේ. පළමු පාර්ශ්වයට අහිමි වූ වැටුප් වර්ධක හා හිඟ දීමනා සියල්ලම යලි ලබාදීමට නියෝග කරමි.

3. පළමු පාර්ශ්වයට වසර 03 ක් දක්වා උසස් වීම් ඉල්ලීමට නොහැකි වූ බවට වූ විනය නියෝගය අහෝසි කරමි.

4. ඉහත 1 හා 2 ට අදාළව පහත සඳහන් පරිදි මුල්‍ය අලාභය ගෙවීමට නියෝග කරමි.

i) 2022.02.01 සිට උපයාගත් වැටුප් වර්ධක ලබා නොදීම නිසා සිදුවී ඇති මූල්‍ය අලාභය — රු. 271,808.00

ii) 2023.08.01 දින සිට මාසික ප්‍රවාහන දීමනාව අහිමි වීම නිසා සිදුවී ඇති මූල්‍ය අලාභය — රු. 2,510,795.00

ගෙවිය යුතු මුළු මුදල — **රු..2,782,603.00**

දෙවන පැමිණිලිකාරිය වන නිරාෂා ගයානි රත්නවීර මෙයට,

i) සේවා තත්ත්වයෙන් පහත හෙළීමේ විනය නියෝගය අහෝසි කර විකිරණ, ආරක්ෂණ හා තාක්ෂණික සේවා අංශයේ වැඩ බලන නියෝජ්‍ය අධ්‍යක්ෂ තනතුරෙහි පළමු පාර්ශ්වය නැවත පිහිටුවා පළමු පාර්ශ්වයට අහිමි වූ සියළු වරප්‍රසාද හා දීමනා හිඟ මුදල් ද සමග නැවත ලබා දිය යුතුය.

ii) පළමු පාර්ශ්වයට අහිමිකළ වැටුප් වර්ධක හා හිඟ දීමනා යලි ගෙවිය යුතු බවට නියෝග කරමි.

iii) පළමු පාර්ශ්වයට වසර තුනක් දක්වා උසස්වීම් ඉල්ලීමට නොහැකි වූ බවට වූ විනය නියෝගය අහෝසි කරමි.

iv) ඉහත i හා ii ට අදාළව පහත සඳහන් පරිදි මූල්‍ය අලාභය ගෙවීමට නියම කරමි.

a.	2022.03.12 දිනට හිමි ශ්‍රේණි උසස්වීම් අහිමි කිරීම සහ 2023 වසරේ සිට වැටුප් වර්ධක විලම්භනය නිසා සිදුවූ මූල්‍ය අලාභය	රු.316,716.00
b.	වැඩ බලන නියෝජ්‍ය අධ්‍යක්ෂ තනතුර 2023.08.01 දින සිට අහිමි කිරීම නිසා වැඩ බලන තනතුරට අදාල මාසික දීමනාව අහිමිවීම නිසා සිදුවූ මූල්‍ය අලාභය	රු.533,400.00
c.	වැඩ බලන තනතුරට අදාල මාසික ප්‍රවාහන පහසුකම් අහිමිවීම නිසා සිදුවූ මූල්‍ය අලාභය	රු. 86,800.00
d.	අහිමි වූ මාසික සන්නිවේදන දීමනාව	රු. 56,000.00
	ගෙවිය යුතු මුළු මුදල	**රු.992,916.00**

ඒ අනුව ඉහත පරිදි කටයුතු කොට පළමු පාර්ශ්වයට ගත හැකිවන පරිදි රු.3,775,519.00 (තිස්හත් ලක්ෂ හැත්තෑ පන්දහස් පන්සිය දහනවයක) මුදලක් මෙය ගැසට් ගත වීමෙන් මසක් ඇතුලත මැද කොළඹ දිස්ත්‍රික් කම්කරු කාර්යාලයේ සහකාර කම්කරු කොමසාරිස් වෙත තැන්පත් කරන ලෙස දෙවන පාර්ශ්වයට නියම කරමි.

තවද අනෙකුත් ව්‍යවස්ථාපිත හිමිකම් සඳහා මෙම ප්‍රදානය බාධාවක් නොවිය යුතුය. මේ වන විටත් ශ්‍රී ලංකා පොලිසිය විසින් ආරම්භ කොට ඇති පරීක්ෂණ ක්‍රියාවලියට මෙම තීන්දුව අගතියක් නොවන බවද වැඩි දුරටත් විශේෂයෙන්ම සඳහන් කරමි.

මෙම තීන්දුව සාධාරණ හා යුක්ති සහගත තීරණයක් බව සඳහන් කරමි.

ආචාර්ය කේ.ඒ. තිලකරත්න,
ඛේරුම්කරු

2026 ජූනි මස 26 වැනි දින,
ඛේරුම්කරු හා කාර්මික අධිකරණ ශාඛාවේදීය.

EOG 10 - 0048